# සමාධි මහා විහාරය

## කලෑත්තෑව. අනුරාධපුර

ශ්‍රී ලංකාවේ නොයෙක් දුර පළාත්වල සිට ඉතා වෙහෙස මහන්සි වී සැදැහැයෙන් යුක්තව ඓතිහාසික අනුරාධපුර නගරය දෙසට යන ගමන් කලත්තෑව සමාධි මහා විහාරයට ගොඩ වැදුණු පින්වත් ඔබ සැමදෙනාම ඉතා දයාබරව පිළිගනිමු.

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික බෞද්ධ විහාර සම්ප්‍රදායෙන් ඔබ්බට ගිය, එමෙන්ම නවතම අත්දැකීමක් ලංකාවාසි බෞද්ධ ජනතාවට ලබාදෙන පිංබිමක් ලෙස මෙම විහාරස්ථානය හැදින්විය හැකිය . එමෙන්ම ඔබටත් එය දැනෙනවා ඇතැයි සිතමු.





මෙම තුන්මහල් විහාර මන්දිරය ඉදිකිරීමෙදි ,ශ්‍රී ලංකාවේ ඉන්ජිනේරු-වන් හා පෙදරේරුවන් ඒ සඳහා යොදාගත්තේ සාම්ප්‍රදායික චීන ගෘහ නිර්මාණ ශිල්පයයි. මේ දර්ශනීය විහාර මන්දිරයේ නිර්මාතෘ තමයි, ආචාර්ය පූජ්‍ය රඹුකේවෙල ඥාණසීහ නායක හාමුදුරුවෝ. උන්වහන්සේ දැනට වැඩවාසය කරන්නේ සිංගප්පූරුවේ සමාධි බෞද්ධ මධ්‍යස්ථානයේ. විසිපස් වසරකට අධික කාලයක් විදේශීය ධර්මධූත සේවයේ යෙදීසිටිමින් උන්වහන්සේ ලැබු කෘතහස්ත අත්දැකීම්වල ප්‍රතිඵලය තමයි මෙම සමාධි මහා විහාරය.





මීට වසර දොළහකට පමණ පෙර මහනුවර වට්ටාරන්තැන්න ප්‍රදේශයේ මහාවැලි ගං මිටියාවතේ සමාධි සංස්කෘතික කේන්ද්‍රය ඉදි කළා. එය තමයි ඥාණසීහ හාමුදුරුවෝ ඉදි කළ පළමු විහාර මන්දීරය, ඒ වගේම එම විහාරය චීන ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ඉදිවුණ ලංකාවේ පළමු විහාරය ද වුනා. ඒ චීන ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ඉදිවුණ දෙවන විහාර මන්දීරය ලෙස මෙම අනුරාධපුර කලත්තෑවේ සමාධි මහා විහාරය හැදින්විය හැකිය. ඉතිං මෙම විහාර මන්දීර දෙකෙන්ම ලෝකයේ බෞද්ධ සම්ප්‍රදායන්ට අයත් විවිධ වු කලා හා සංස්කෘතිමය අංගයන් පිළිබඳ දැනුමක් හා අවබෝධයක් ලංකාවාසී බෞද්ධ ජනතාවට ලබාදෙනවා.

"**සමාධි**" යනු කාටත් ලබාගත හැකි දියුණු මානසික තත්වයක්. නිරන්තරයෙන් අවුල් වියවුල් බවට පත් වෙන මිනිස් සිත දසදෙස දුවපැන යාමට ඉඩ නොදී නිවී සැනසුන එකක් බවට පත් කරගැනීමද "**සමාධිය**" ලෙස හැදින්විය හැකිය .

සිතේ "**සමාධි**"යට ජාති කුල ආගම් හා සංස්කෘතිම බේදයක් නැත. එමෙන්ම මේ සමාධි මහා විහාරයද ජාති කුල හා ආගම් බේදයෙන් තොර වු සංස්කෘතික මධ්‍යස්ථානයකි. ලෝකයේ සතර දෙසින් පැමිණෙන සියළුජනයාට මෙම මධ්‍යස්ථානය විවෘතයි. එමෙන්ම ලෝකයේ විවිධ බෞද්ධ සම්ප්‍රදායන් ගැන කියාදෙන තොරතුරු මධ්‍යස්ථානයක් ලෙසද හැදින්විය හැකිය.

මෙම විහාර මන්දීරයේ ඉදිරිපසින් ඇත්තේ භික්ෂුන් වහන්සේලා වැඩසිටින සංඝා වාසයයි. ඊට දකුණු පසින් ඇත්තේ " **සමාධි** "සම්මන්ත්‍රණ ශාලාවයි. මෙම දර්ශනීය විහාර මන්දීරයේ පළමු මහළ විදේශීය ආරාධිත අමුත්තන්ගේ විවේකස්ථානයයි.





දෙවන මහළ විහාර මන්දීරයයි. සැදැහැවතුන් සිය ගණනකට එකවර වන්දනාමාන කළ හැකි වන පරිදි ශාලාව ඇතුළත ඉඩ ප්‍රමාණය පුළුල් කර ඇත. මහාපාරෙ සිට ප්‍රධාන දොරටුවෙන් ඇතුල් වු කළ දක්නට ලැබෙන්නේ ප්‍රධාන පඩිපෙළ දෙපස ඇති ශෛලමය සිංහ රූප දෙක. එය චීනයේ නිර්මාණය කරන ලද්දකි. අවසන් පඩිපෙළියේ සිට ඔබ ඉහල බලන විට දක්නට ලැබෙන්නෙ විහාර මන්දිරය තුළට පිවිසෙන ප්‍රධාන දොරටුවයි. එය කවුළු තුනකින් යුක්තයි. දොරටු වසා තබන විට දාගැබක අසිරිය ගනී. ඒ කියන්නෙ ඔබ දැන් ශ්‍රී ලංකාද්විපයේ රජරට දාගැබ්පුරයට පිවිස ඇති බවයි. දොරටු තුන විවර කරමින් ඔබ ඇතුල් වන්නේ ශීල, සමාධි, ප්‍රඥ නම් ආර්යය ධර්මය වැඩිමටයි. මැද දොර විවර කළ විට ඔබට දැකිය හැකි වන්නෙ මෙම විහාරයේ සමාධි බුද්ධ ප්‍රතිමාවයි.

මෙම ප්‍රතිමාව බුරුම රට මණ්ඩල නම් පුරවරයෙන් ගෙන්වන ලද අතර එය කිරිගරුඬ පාෂාණයෙන් බුරුම බුද්ධ ප්‍රතිමා කලාවට අනුව නිර්මාණය කරන ලද්දකි , එය උසින් අඩි 8කි. බරින් ටොන් 7 1/2 කි. එය ලංකාවේ විශාලතම මාබල් බුද්ධ ප්‍රතිමා වහන්සේලා අතරින් එකකි . එමෙන්ම ප්‍රතිමා දෙපස ඇති පෝසිලෙන් මල් පෝච්චි දෙක ද චීන කලා කරුවන්ගේ නිර්මාණයක් වන අතර එය සිංගප්පූරුවේ සිට ලංකාවට ගෙන





විහාර මන්දිරය තුළට පැමිණ දණ ගසා හිස නමා තුන් වරක් බුදුරජාණන් වහන්සේට නමස්කාර කර එරමිණිය ගොතා වාඩිවෙන ඔබට ඊළඟට දක්නට ලැබෙන්නෙ සිවිලිම් දාරයේ එල්ලා ඇති ඝණ්ඨාරයි. ශ්‍රී ලංකාවේ අනිකුත් විහාරස්ථාන වල බෝහෝ වෙලාවට දක්නට ලැබෙන්නේ එක් ඝණ්ඨාරයක් පමණි. නමුත් මේ විහාර මන්දීරය තුළ ඔබට ඝණ්ඨාර 108 ක් දැකිය හැකිය. මීට පෙර අපට ලංකාවේ ඝණ්ඨාර වැඩි ප්‍රමාණයක් දක්නට ලැබුනේ කොවිල් හා දේවාල වලයි.

ඒ කෝවිල් වල දෙවියන් උදෙසා කරන ශබ්ද පූජා සම්ප්‍රදායට අපි නව බෞද්ධ මුහුණුවරක් දෙමින් එය පන්සල තුළට රැගෙන ආවා. මේ ඝණ්ඨා 108 පිළිබිඹු කරන්නේ බෞද්ධ සංස්කෘතියේ කියාදෙන නවගුණ වැලයි. ඒ නවගුණ වැලේ කීකිරිදිය ඇට 108ක් තියෙනවා. අතීතයේ බොදුනුවන් බුදුරජාණන් වහන්සේගේ නව අරහාදි බුදු ගුණ මෙනෙහි කරමින්, සජ්ඣායනා කරමින් නවගුන වැල ගණන් කරයි. ඉතිං මේ විහාරස්ථානයේ විශේෂිත වු දිනයන්හි නව අරහාදි බුදු ගුණ සජ්ඣායනා කරමින් පුදගලයින් 108 දෙනෙක් විසින් ඝණ්ඨාර 108, 108 වරක්ම නාද කරනවා. මෙයින් සිදුවන්නෙ නව අරහාදි බුදු ගුණ සජ්ඣායනයේ නවගුණ ශාන්තිය හා ඝණ්ඨා නාදයේ ශබ්ද තරංග එකම වෙලාවෙ සමාධි ගතව විශ්වයට මුදාහැරීමයි.





ඊ ළඟට ඔබට දැකිය හැකි වන්නේ ප්‍රධාන මල් ආසනය දෙපස ඇති ඉතා සුවිශේෂ වු දෙයකි. දකුණ පස ඇත්තේ පස් ලෝහයෙන් නිර්මාණය කර ඇති පාත්‍ර යක හැඩයකින් යුත් භාණ්ඩයකි. වම් පස දක්නට ඇත්තේ ලී වලින් නිර්මාණය කර ඇති මාළුවෙකුගේ හිසක හැඩයකින් යුත් භාණ්ඩයකි. මේ සුවිශේෂ වු භාණ්ඩ දෙකම යොදා ගන්නේ තෙරුවන් උදෙසා ශබ්ද පුජා පැවැත්වීමටයි. චීන බෞද්ධ භික්ෂුන් වහන්සේලා වන්දනාමන කරන විට මෙම භාණ්ඩයන් වාදනය කරමින් සූත්‍ර සජ්ඣායනා කරති.

සමාධි බුද්ධ ප්‍රතිමාවට පසුපසින් ඇති කොටසේ තවත් සුවිශේෂ දෙයක් දැකිය හැකිය. එනම් විශාල ලී රාමුවක් මත කැටයම් කර ඇති රත්නමාලා බන්ධන යන්ත්‍ර රාජයායි.



ඓතිහාසික තොරතුරු වලට අනුව මුලින්ම මෙම යන්ත්‍ර රාජයා සොයා ගනු ලැබුවේ මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ සිවිලිමක් මත නිර්මාණ කර තිබියදීය. උදේ හවා මෙය සජ්ඣායනා කිරීමෙන් සියළු දෙනාටම සෙතක්, ශාන්තියක් හා සහනයක් ලබා ගත හැකි බව එහි සඳහන්ව තිබුණි.

ඊට අමතරව රත්නමාලා බන්ධන යන්ත්‍රයට දෙපසින් ලංකාවේ පෞරාණික බෞද්ධ සංස්කෘතියේ යන්ත්‍ර මන්ත්‍ර කලාවට අනුව නිර්මාණය වූ සීවලි දැහැන සහිත සීවලි යන්ත්‍රය ද දැකිය හැකිය. අටමස්ථාන වන්දනාව සඳහා අනුරාධපුර පූජා නගරයට පිවිසීමට බලාපොරොත්තු වන ඔබ, එක්වරක් මේ රත්නමාලි ගාථා රත්නය සජ්ඣායනා කොට මේ පින් බිමෙදි ජේවී රම්‍ය වූ ඒ අටමස්ථානය බලා ගමන් අරඹන්න. විහාරස්ථානයට ආධාර උපකාර ලබා දීමේදි නිකුත් කරන රිසිට් පතක් සමඟ ඔබට මේ රත්නමාලා බන්ධන යන්ත්‍ර යේ අනුරුවක්ද ලබා ගත හැකි බව කරුණාවෙන් මතක් කර සිටිමු.

දැන් අපි ඔබේ අවධානය යොමු කරන්නේ මේ විහාර මන්දීරයේ තුන්වන මහළයටයි. එයද දෙවන මහළ සේ පිඟන් ගඩොල් අතුරා දර්ශනීය ලෙස නිමකර ඇත. තුන්වන මහළට පිවිසෙන ඔබට විවිධ වර්ගයේ හා විවිධ හැඩයෙන් යුක්ත පිළිම දැකිය හැකිය.

මේ පිළිම සියල්ලක්ම විවිධ බෞද්ධ රටවල බෞද්ධ සංස්කෘතීන්ට අයත් කලා කෘතීන්ය. ලෝකයේ ප්‍රධාන වශයෙන් බෞද්ධ සම්ප්‍රදායන් දෙකක් තියෙනවා. ඒ බෞද්ධ සම්ප්‍රදායන් දෙකම ලෝකයේ විවිධ රටවල පැතිර තියෙනවා.

තායිලන්තය, බුරුමය, කාම්බෝජය, ශ්‍රී ලංකාව ආදි රටවල ඈත අතීතයේ සිටම ඇත්තේ ථේරවාදි බෞද්ධ සම්ප්‍රදායයි. ජපානය, චීනය, තායිවානය, කොරියාව, වියට්නාමය ආදි රටවල ප්‍රචලිත වී ඇත්තේ මහායාන බෞද්ධ පිළිවෙතයි. ඉතිං මෙම පුණ්‍ය භූමියේදි ඒ සියලුම සම්ප්‍රදායන් වලට අයත් බුදු පිළිම, බෝධිසත්ව පිළිම ,දේව පිළිම, ස්තූප ආදි කෞතුක භාණ්ඩ රැසක්ම දැක බලාගැනීමට හැකිය.





බෞද්ධ කලා කෘතිවලට අමතරව චීනයේ ඉතා පැරණි ජන ආගම් වන තාඕ හා කොම්පියුසියස් ආගම් වලට අයත් කලා කෘතිද මෙහිදි දැක බලා ගැනීමට පුළුවන. ඊට අමතරව ඉන්දියානු කලාකරුවෙක් විසින් චිත්‍රයට නගන ලද ගෞතම බුදුරජාණන් වහන්සේගේ බුද්ධ චරිතය ඇතුළත් පිංතූර පෙළක් ද මෙහි ප්‍රදර්ශනයට තබා ඇත.



ඉහළ මහළයට ඇතුළත් වන තැනම දක්නට ලැබෙන්නේ, චීන බෞද්ධයන් විශ්වාස කරන අන්දමට බුදු සසුන හා පන්සල් වෙහෙරවිහාර ආරක්ෂාකරන "චියේ ලාන්" නම් දෙවියන්ය. ඇතැම් චීන බෞද්ධයන් මෙය බෝධිසත්ව වරයෙක් ලෙස ද හඳුන්වයි.



ඉන්පසු ඇති පිඟන් මැටියෙන් සාදා නිල්පාටින් ආලේප කර ඇති පිළිම තමයි චීන බෞද්ධ සම්ප්‍රදායට අනුව හඳුන්වන රහතන් වහන්සේලා, ඔවුන් විශේෂයෙන් ගරු කොට සලකන රහතන් වහන්සේලා 18 නමක් වැඩසිටිනවා.





ඊට අමතරව අත් දාහක් හා නෙත් දාහක් ඇති අවලෝකතීශ්වර බෝධිසත්ව පිළිමය දැකිය හැකිය. මිනිස් ලෝකයේ ජීවත් වන හුදි ජනයාගේ හදවත් වලින් නැගෙන අඳෝනාවලට සවන් දී, අනතුරුව ඔවුන් සිටින තැන් වලට ගොස් ඒ අසරණජනයාට පිහිටවන බෝධිසත්ව වරයෙකු ලෙසද අවලෝකතීශ්වර බෝධිසත්වයන් හැඳින්විය හැකිය.

මේ පිළිම අතර ඔබ මීට පෙර දැක ඇති විශේෂ පිළිමයක් තියෙනවා. හිස මුඩු කරගත් මුව පුරා සිනහාවක් ඇති, ඒ වගේම දැක්කම අතගාන්ට ආශා හිතෙන විශාල බඩක් ඇති ලී වලින් නිර්මාණය කළ පිළිමයක් , චීන බෞද්ධ සම්ප්‍රදායට අනුව ඒ තමයි මතු බුදුවන මෛත්‍රි බෝධිසත්වයාණන් වහන්සේ. "මෛත්‍රීය" කියන්නෙ යහළුකමයි. කෙනෙක් සමග යහළු වෙන්න නම් පළමුවෙන් සිනහ වෙන්න ඕන. ඉතිං මේ පිළිමය හැමවෙලාවේම සිනහාවෙලා ඉන්න හැටි දැක්කම අපටත් සිනහා යනවා. ඒ සිනහා යන්නේ කාටවත් උපහාසයට නොවේ.






හිතේ තියෙන යහළුකමටයි. චීන සංස්කෘතියේ ගෘහ නිර්මාණ ශිල්පයේදි යොදා ගන්නා ප්‍රබල නක්ෂාස්ත්‍ර ක්‍රමයක් තියෙනවා "ෆොන් සුවේ" (Feng Shui) කියලා, අද වුවත් චීනයේ බොහෝදෙනෙක් මේ ක්‍රමයට අනුව තමයි ගෙවල් දොරවල්, වෙළඳසැල් හදන්නෙ, ඉතිං ඒ අය අතර, මේ මෛත්‍රි බෝධිසත්ව පිළිමය හරි ජනප්‍රියයි. ඔවුන් එය සලකන්නෙ මතු බුදුවන මෙතෙ බුදුන් හැටියට නොවේ, තම නිවසට, වෙළඳ පළට හා රැකියා ස්ථාන වලට වාසනාව ගෙනත් දෙන දෙවි කෙනෙකු ලෙසයි. ඒ නිසා බොහෝ වෙළඳ සැල් ඉදිරිපිට මෙම පිළිමය දැකිය හැකිය. වර්තමානය වන විට ලංකාවේ ද මෙම "ෆොන් සුවේ" ක්‍රමය ක්‍රමක්‍රමිකව ප්‍රචලිත වෙමින් පවති.






මහායානික බෞද්ධයන් විශ්වාස කරන තවත් බුද්ධ මණ්ඩලයක් බටහිර දිශාවේ පිහිටා ඇත. එහි දැනට බුදු කෙනෙක් වාසය කරයි. උන්වහන්සේ "අමිතාභ" බුද්ධ යන නමින් හඳුන්වයි. ඉතිං තුන්වන මහලේ ඇතුල් වන පැත්තේ අවසානයට දක්නට ඇත්තේ ඒ අමිතාභ බුදුන්ගේ පිළිමයයි. උන්වහන්සේගේ දෙපසින් මංජු ශ්‍රී හා සමන්තභද්‍ර නම් බෝධිසත්වයන් දෙපළ වැඩවෙසෙති. අවසාන අදියර වශයෙන්, අපි ඔබේ අවධානයට යොමු කරන්නේ තුන්වන මහළේ පිටවීම් දොරටුව ඇති පැත්තටයි.











මෙම කොටස තුළද විවිධ රටවල් වලින් ගෙන්වන ලද බුද්ධ ප්‍රතිමා හා බෝධිසත්ව පිළිම දැකිය හැකිය. එමෙන්ම චීන සංස්කෘතියට අයත් මල්වැල්, ලියකම් වලින් අලංකාර කරන ලද පිඟන් මැටි මල් පෝච්චි, කෝප්ප, පීරිසි ආදියද මෙහිදි දැකිය හැකිය.

මීට අමතරව ලෝකයේ විවිධ රටවල ඇති විශේෂිත වූ, එමෙන්ම පුදුමය උපදවන සුලු ගොඩනැගිලි, කුළුණු, පාළම්, දේවස්ථාන හා පිළිරුවල ලී වලින් තැනූ ආකෘති ද නැරඹිය හැකිය, මේ සියලු දේ නරඹා තුන්වන මහළේ පිටව යෑමට තරප්පු පෙළ මතට පැමිණෙන ඔබට දක්නට ලැබෙන්නේ මෙම දර්ශනීය විහාර මන්දිරය ජාතියට දායාද කළ පූජ්‍ය රඹුක්වෙල සද්ධාණසීහ නායක හාමුදුරුවන්ගේ ඡායා රූපයයි.

චීනය, වසර 5000 පමණ ලිඛිත ඉතිහාසයක් හා වැඩිම ජන සංඛ්‍යාවක් ජීවත් වන ලෝකයේ විශාල අධිරාජ්‍යයන්ගෙන් එකකි. ඒ මහා චීන අධිරාජ්‍යය සතු අභිමානවත් සංස්කෘතිය හා ආර්ථික සංවර්ධනයේ සැඟවුන රහස් අනාගතයේ දිනකදී ලෝකය පුරා ප්‍රචලිත වන බව මීට වසර 25 කට පමණ පෙර අවබෝධ කරගත් උන්වහන්සේ, බෞද්ධ සංකල්පයන්ගෙන්ද පෝෂිත වූ ඒ අභිමානවත් වූ මහා සංස්කෘතිය පිළිබඳ දැනුමක් හා අවබෝධයක් ඔබ සැමට ලබාදීම අරමුණු කරගෙන මෙම සමාධි මහා විහාරය ඉදිකරන ලදී. චීන සංස්කෘතියේ අභිමානවත් බව හෙළ සංස්කෘතියට කියාදෙන ආයතනයක් හැටියටත්, හෙළ බොදු සංස්කෘතිය ගැන ලෝකයට හඬගා කියන බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානයක් හැටියටත් මේ පිංබිම ඔබට හඳුන්වාදීමට පුළුවන.






මෙම විහාර මන්දිරයේ විශාල වීදුරු ජනේල අතරින් ඔබට මෙම විහාර මන්දිරය අවට ඇති ස්වාභාවික සෞන්දර්යය අත්විඳිය හැකිය. මන්දිරය පසු පස ඇති කවුළු තුළින් ඔබට දිස්වෙන්නේ මිහින්තලා මහා සෑයයි. ප්‍රධාන දොරටුව අභියස සිට ඉදිරිපස බැලුවිට දිස්වන්නේ නුවර වැවේ අසිරියයි. මෙ අවට පැහැදිළි අහස් කුසක් දිස්වෙන මොහොතක රුවන්වැලි සෑයේ කොත් වහන්සේ ද දැකිය හැකිය.

ඉතිං ඔබ මෙතෙක් වෙලා නුවරවැවේ නිල් දිය දහර සිඹිමින් හමා එන මඳනලේ සුවය විඳිමින්, සමාධි මහා විහාරයට ගොඩ වැදි අපත් සමග "සමාධියට" සමවැදුනු පිංවත් ඔබ සැම දෙනාටම ගොඩාක්.................. පිං !

**සැමදෙනාටම තෙරුවන් සරණයි. !**

ඔබ ලැබූ සමාධිය

අප ලබන ශාන්තියයි !

සමාධි ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය
**SAMADHI INTERNATIONAL BUDDHIST CENTRE**
Kalettewa. Kurundankulama.
Anuradhapura, Sri Lanka
Tel: 94-77-6326272 Fax : 94-25-2237640
Email : seehasamadhi@yahoo.com.sg